**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

**පළමු වාර පරීක්ෂණය 2018**
**முதலாம் தவணைப் பரீட்சை 2018**
**First Term Test 2018**

**6 ශ්‍රේණිය**
**தரம் 6**
**Grade 6**

***පෙරදිග සංගීතය - I***
***Oriental Music - I***

***පැය 2 යි***
***2 Hour***

නම / විභාග අංකය ..............................................................................................................................................

- **වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. කනට ඇසෙන සියලුම මිහිරි හඬවල්,

   i.ශබ්ද වේ ii.නාද වේ iii.ස්වර වේ iv.ඝෝෂ වේ

2. පහත හඬවල් අතරින් නාදයක් ලෙස හැඳින්විය හැක්කේ,

   i.සර්පිනාවේ හඬ ii.කර්මාන්තශාලාවක හඬ
   iii.අකුණු හඬ iv.වාහනයක් ගමන් කරන හඬ

3. සප්තකයේ මූලික ස්වර ගණන කීයද?

   i. 5කි ii. 7කි iii. 6කි iv. 9කි

4. මධ්‍යමයට වඩා ඉහළ හඬක් ඇති ස්වර මොනවාද?

   i. රි , ම ii. ස , රි iii.ධ , නි iv. රි , ග

5. බටහිර සංගීතයේදි ගායනය වන Do , Re , Mi , Fa ස්වරවලට සමාන පෙරදිග ස්වර වන්නේ,

   i.මගරිස ii.සරිගම iii.සනිධප iv.ගරිමග

6. භාරතීය සංගීතයේ ප්‍රධාන සංගීත පද්ධති 2කි.එනම්,

   i. උත්තර භාරතීය හා උතුරු ඉන්දීය යනුවෙන්.
   ii. උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය යනුවෙනි.
   iii. පෙරදිග හා අපරදිග යනුවෙනි.
   iv. අපරදිග හා දකුණු ඉන්දීය වශයෙනි.

- **වරහන් තුළ දී ඇති පද උපයෝගී කර ගනිමින් පහත හිස්තැන් පුරවන්න.**

(තබ්ලාව , බටනලාව , රිෂභය , ස්වර , වයලීනය)

7. රි ස්වරයේ ස්වර නාමය .................................................වේ.
8. .................................... සුළඟේ ආධාරයෙන් නාදය නිපදවන සංගීත භාණ්ඩයකි.
9. .................................... තත් හතරකින් සමන්විතය.
10. කඳුපෙළ අතරේ ගීතය .................................... ස්ථාපන ගීතයකි.
11. තාල වාද්‍ය භාණ්ඩයක් ලෙස ..................................... හැඳින්විය හැක.

- **පහත සඳහන් කියමන් හරිනම් හරිලකුණද වැරදිනම් වැරදි ලකුණ ද යොදන්න.**

12. ආදරේ ඇයි පොඩි හඳ මාමේ යන ගීතය ස්වර ස්ථාපන ගීතයකි. ( )
13. තබ්ලාව කොටස් දෙකකින් යුක්ත වේ. ( )
14. සිතාරය , අළුව (bow) යොදාගෙන නාදය නිපදවෙන සංගීත භාණ්ඩයකි. ( )
15. එස්රාජයට හැඩයෙන් සමාන භාණ්ඩයක් ලෙස දිල්රුබාව හැඳින්විය හැක. ( )
16. බටනලාවේ ඇති සියලුම සිදුරු ගණන හතකි. ( )

- **A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 17. බායාව හා දායාව යන කොටස් දෙකකින් යුත් වාද්‍ය භාණ්ඩයකි. | i.නායකීතාර් |
| 18. සිතාරයේ ප්‍රධාන තත හඳුන්වන නමකි. | ii.ගිටාරය |
| 19. ස්වර පුවරු භාණ්ඩ වර්ගයට අයත් සංගීත භාණ්ඩයකි. | iii.තබ්ලාව |
| 20. තත් 6කින් යුත් පික් එකකින් වයන භාණ්ඩයකි. | iv.සර්පිනාව |

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

1 ඔබ උගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ලියා දක්වන්න.

2 i. පහත සඳහන් වචන උපයෝගී කර ගනිමින් දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

(වයලීනය , එස්රාජය , මැන්ඩලීනය , බටනලාව , ගිටාරය , මවුත් ඕගනය , සර්පිනාව , දිල්රුබාව)

| අළුවෙන් (bow) වයන | පික් (pick) එකෙන් වයන | සුළගේ ආධාරයෙන් හඬ නිපදවන |
|---|---|---|
| | | |
| | | |
| | | |

ii. ඔබ කැමති සංගීත භාණ්ඩයක රූප සටහනක් අඳින්න.

3. i. පෙරදිග සංගීතයේ යෙදෙන ස්වර 7 ලියා ඊට ගැළපෙන බටහිර සංගීතයේ ස්වර ලියා දක්වන්න.

ii. පෙරදිග ස්වර නාම හා අපරදිග ස්වර නාම ලියා දක්වන්න.

4. ඔබ උගත් ළමා ගීතයක් ලියන්න.